

# සයිප්‍රස් හි පොසොන්

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාද්වීපයට සම්බුදු දහම රැගෙන ආ සුවිශේෂී දිනය පොසොන් පොහෝ දිනයයි. එය ලක්වාසි බෞද්ධ ජනතාව ඉතා ඉහළින් සමරා ආගමික වතාවත් හි යෙදෙන පොහොයකි. සම්බුදු දහම ලැබීමෙන් පසු ශ්‍රීලංකාව බොහෝ ලෙස සංවර එමෙන්ම අවිහිංසාව මුල්කරගත් සමාජයක් බවට හැරුණේ ඒ උතුම් දහමේ ආභාෂයෙනි. ශ්‍රී ලංකාව ධර්මද්වීපයක් ලෙස නම් ලැබුයේද මහින්දාගමනයෙන් පසු සම්පූර්ණයෙන්ම රට යහපත් අතට හැරුණු බැවිනි.

ලෝකයේ දසත විසිරී වෙසෙන බෞද්ධ ලාංකික ජනතාව පොසොන් පොහොය මහත් බැතියෙන් සමරණ බව අපි දනිමු. අප වෙසෙන මේ සයිප්‍රස් රටේ ද එය මහත් ඉහලින් සිදුකරන්නට මෙහි ඇති එකම බෞද්ධ විහාරය වන ලංකාරාමයද මෙහි පිහිටුවා තිබෙන ශක්තිමත්ම සංවිධානය වන සයිප්‍රස් බෞද්ධ සංවිධානයද වසරක් පාසා කටයුතු කරති.

මෙම මාසය පුරාම සයිප්‍රසයේ ප්‍රධාන අගනගරය කේන්ද්‍රකර ගනිමින් විවිධ ආගමික වැඩසටහන් දියත්විය. පොසොන් මස මුල් සතියේ 3 වන ඉරුදින පාපොස් නගරයේ ශ්‍රී පූජ්‍ය පැලැම්පිටියේ මහින්ද ස්වාමීන් වහන්සේ හා පූජ්‍ය කුඹුක් මුල්ලේ සිරිසුමන ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත් වයෙන් සීල භාවනා භක්ති ගී හා ධර්ම දේශනා පැවැත්වුණු අතර එය එහි ප්‍රධාන සංවිධායක මාලි ලියනගේ මහත්මිය ප්‍රමුඛ සැදැහැවත් පිරිසගෙන් ඉටුවීය.

ඒ අතර ලර්නකා නගරයේ මහා පොසොන් දන්සැලක් ද පැවැත්වුණු අතර 10 වන ඉරු දින සයිප්‍රස් අගනුවර වන නිකෝසියා හි ලංකාරාමයේදී සීල භාවනා වැඩ සටහන් නොඅඩුව සිදුවූ බව ප්‍රීතිමත් සැදැහැසිතින් මෙහි ලා සඳහන් කරමි.

♦ **සටහන - විමලා යාපා**
**නිකෝසියා - සයිප්‍රස් Cyprus**

# පාසැල් සමයේ වීරයෙකු වන්නේ කෙසේද?



එවකට මා අටවන ශ්‍රේණියේයයි සිතමි. අකුරුකළ තර්ස්ටන් විදුහලට යාබදව දෙපසින් තිබුණේ කොළඹ විශ්වවිද්‍යාලයත් රාජකීය විද්‍යාලයත් ය. කොටින්ම මායිමේ එක් ගොඩනැගිල්ලක තිබුණු පන්ති පේළියකින් කොටසක් අපට ද, කොටසක් රාජකීය විදුහලට ද අයත්ව පැවතියේ ය.

දිනක් උදෑසන වාර විභායකට සහභාගිවෙමින් සිටි අපට මහා ඝෝෂාවක් මෙන්ම, අප සිටි පන්ති කාමරයේ වහළට මහා ගල්වරුසාවක් වැටෙනවා ඇසිණ. අපි එක්වරම එළියට පැනගතිමු. අප විදුහලේ ජ්‍යෙෂ්ඨ සිසුන් තවත් කණ්ඩායමක් සමග සටනක පැටලී ඇත. අපිද එයට එක්වීමු. අපේ විරුද්ධවාදීන් කවුරුදැයි අප දන්නේ නැත. අහුලාගත හැකි හැම ගලක්ම ගෙන අපි ඔවුන් දෙසට දමා ගැසීමු. " මේ කැම්පස් කොල්ලෝ " යයි කවුද කියනවා ඇසිණ. ඔලු දැතින් බදාගත් සිසුහු දෙපසේම වැතිර සිටිති. රණ්ඩුව කුමක් නිසා දැයි සිතන්නට, අසන්නට වෙලාවක් නැත. ගල්ගැසීම නොකඩවා සිදුවෙයි. ඒ අතර දෙතුන් දෙනෙක් ඉදිරියේ පොරකමින් සිටිති. ගුරුවරුද එහෙ මෙහෙ දුවමින් මෙම සටන නවතන්නට උත්සාහ ගනිති.

මා ඉදිරියේ මගේ මිත්‍ර ශාන්තය. උත්පත්තියෙන්ම දඟකාරයෙක් වන ඔහු කිසිවකට පස්සට නොයන්නෙකි. ශාන්ත ඉදිරියෙන්ම සිට ගල්පහර දෙමින් සිටී. එක්වරම ඔහු බිම ඇද වැටිණ. ඔහු ඔළුව දැතින් බදාගෙන වේදනාවෙන් කෑගසයි. අපේ පැත්තෙන්ම ගැසූ ගල්පහරක් ඔහුගේ ඔලුවේ පසුපස වැදී ඇත. ඔහු ඔසවාගෙන පන්ති කාමරයකට රැගෙන ගියෙමු. "අනේ අම්මට කියන්න එපා" ඒ ඔහුගේ එකම ඉල්ලීමයි. ගුරුවරුන්ගේද සහාය ඇතිව තුවාල කරුවන් කීපදෙනෙක් දමාගත් වාහනය මහ රෝහල කරා ඉගිල්ලෙයි. ශාන්ත වත්තම් කරගෙන සිටි මගේ සුදු කමිසය ලෙයින් තෙත්වී ඇත. ඔහු වාට්ටුවට ඇතුල් කර විනාඩි පහළොවක් යන්නට පෙර ඔහුගේ මව සහ සහෝදරිය හඬා වැටෙමින් එහි පැමිණියහ. ඒ කවුදෝ ගුරුවරයෙක් ශාන්තගේ ඉල්ලීම ඉටුකර තිබු සැටිය. වෙනදා සුහදත්වයෙන් මා හා කතා බහ කරන ඔහුගේ මව සහ සොහොයුරිය මා දෙස රවා බලමින් සිටියහ. මම ඔවුන් ගේ ඇස් නොදැක්කා මෙන් හැසිරුනෙමි.

විශ්වවිද්‍යාලය හා අප අතර වූ සටනට හේතුවී තිබුණේ මහ අද්භූත කාරණයකි. රාජකීය විදුහලට අනෙක් පසින් පිහිටි පෙම්බ්‍රෝක් නම් පුද්ගලික විදුහලේ සිසුවෙක් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවකට නොමනා විහිලුවක් කොට තර්ස්ටන් විදුහලට ඇතුල් වී තාප්පයෙන් පැන රාජකීය විදුහල හරහා ඔහුගේ විදුහලට ගොස් ඇත. එය නොදත් විශ්ව විද්‍යාල සිසුහු ඔහු තර්ස්ටන් ශිෂ්‍යයෙකැයි සිතා අප විදුහලට ඇතුල් වී කෝලාහලය පටන් ගත්හ.

දැන් වෙලාව සවස දෙකට පමණ ඇත. මට ගමනක් යාමට තිබේ. ඒ බම්බලපිටියේ කාන්තා විදුහලක ඉගෙනුම ලබන සිසුවියකට දුන් පොරොන්දුවක් ඉටුකිරීම සඳහාය. ඇගේ පාසැල අවසන් වනතෙක් ඒ අසල වූ බස් නැවතුමේ ගැවසෙමින් සිටි මා දෙස

## ඇත්ත කෙටි කතාව

කීප දෙනෙක් ඇස්කරකවා බලනවා දුටිමි. ඔවුනට නොපෙනෙන්නට ලෙයින් තෙත්වී පැල්ලම් වූ කමිසය පොත් මිටියෙන් වසා ගතිමි. පාසැල ඇරී ඇය ආවාය. බසයට ගොඩවූ ගමන් අප කළ සටන ගැන ඇයට උජාරුවෙන් පැවසීමි.

ලේ පැල්ලම් කමිසය වීරයෙක් ලෙසින් නිරාවරණය කළෙමි. කතා බස් කරමින් රත්මලාන තෙක් බසයෙන් ගොස් ඇය ගේ අසලටම ඇරලවා ආපසු ආවෙමි. එකල අප ජීවත් වූ මරදානේ පොලිස් නිවාස අසලට පැමිණෙන විට සවස පහට පමණ ඇත.

දොර හැරියෙමි. ගෙදර ඉස්තෝප්පුවේ කීප දෙනෙකි. අම්මා කෙළවරක හඬමින් සිටී. අක්කලා ද ඇය වටා ය. තාත්තාගේ යහළුවන් දෙතුන් දෙනෙකුද සිටිති. මා දුටු විගස මුළු ගෙයම මීයට පිම්බාක් මෙන් නිහඬ විය. දිව ආ අම්මා කිසිත් නොකියා මා තරයේ බදාගත්තාය. අන්දුන්කුන්දුන් වූ මම නිහඬව මගේ කාමරයට ගියෙමි. මා පසුපස දුව ආ පොඩි අක්කාගෙන් කාරණය දැන ගතිමි.

තර්ස්ටන් විද්‍යාල හටන ගැන තාත්තා දැනගත් විගස ඔහු විදුහල කරා ගියේ මට ගෙදර යන්නට යයි කියන්නටය. එහෙත් මා සොයාගැනීමට ඔහුට බැරි විය. යමෙක් පැවසූ කරුණු අනුව මා රෝහලට ගෙන ගොස්ය. වහාම මහරෝහලට ගිය තාත්තා සෑම තැනම මා සෙවීය. කොටින්ම මෝචරියටද ගොස් ඇත. නැවත කන්තෝරු නොගිහින් ගෙදර ගිය ඔහු අම්මාට මේ බව පවසා මගේ මිතුරු ශාන්තගේ නිවසට දුරකතන පණිවුඩයක් දී තිබේ. එයට පිළිතුරු දුන් ඔහුගේ සොහොයුරිය කියා ඇත්තේ මටත් තුවාල වී ඇඟ පුරා ලේ තිබුණු බවත් මා රෝහලේ කොහේ හෝ ඇති බවත්ය. පොලිස් බලය යොදා සෙවූවත් හමු නොවීය. මා ගෙට ගොඩ වූයේ ඒ කලබලය අතරතුර ය.

මට ගෙදරින් කිසිදු තරවටුවක් වුණේ නැත. මා කොහේ ගියාදැයි කිසිවෙකු මගෙන් ප්‍රශ්න කළේ ද නැත. ගිය ගමන ගැන මේ ලියන මොහොත වන තුරා මා කාටවත් කීවේ ද නැත. මේ සියල්ල සිහි වෙත්ම දැන් මගේ සිතට නැගෙන්නේ සිනහවකි. පාසැල් වීරත්වය එසේ ය !

♦ **නීතිඥ**
**අනුර හෑගොඩ London**



## දේශපාලන අනාගතය ?



Mr Sarath Fonseka

හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහත්තෙයා ළඟදී හිරෙන් නිදහස් වෙලා ගෙදර ආවා. ඒ නිදහස්වීම ගැන විවිධ මත හා අදහස් පළවුණා, කලින් සහ ආවට පස්සෙත්. සමහරු ඔහු දකින්නේ තම නිදහස වෙනුවෙන් කිසි කෙනෙකුට බැගෑපත් නොවුණු වීරයෙක් හැටියට. සමහරු කියනවා, ජෙනරාල් බැගෑපත් නූනත් එයා වෙනුවෙන් බැගෑපත් වුණේ ටිරාන් අලස් ය කියලා. තවත් සමහරු කියනවා මිසිස් අනෝමා ෆොන්සේකා මැඩම් ශිරාන්තිට කියලා ජනාධිපතිවරයාට කියෙව්වයි කියලා. ඔය කියුම් කිසි දේක ඇත්ත නැත්ත හරියට ඔය කියන අය දන්නෙත් නැහැ අපි දන්නෙත් නැහැ. ලංකාවෙ හැටි එහෙමයි. හරියට ඒ වෙලාවෙ ළඟ හිටියා වගේ මවලා කියනවා. ඒ නිසා ඒ කියුම් ගැන එච්චර විස්වාසයක් තියන්න අමාරුයි. කොහොම නමුත් සරත් ෆොන්සේකා නිදහස් වෙලා ගෙදර ආපු බව නම් ඇත්ත.

සරත් ෆොන්සේකා හිතන්නෙ තම අනාගතය තියෙන්නෙ දේශපාලන භූමියේය කියලා. යුද්ධයක් දිනූ සේනාංකයක හමුදාපති හැටියට හිටපු නිසා දේශප්‍රේමී ලාංකික ජනතාවගේ ඔහු කෙරෙහි කිසියම් භක්ත්‍යාදරයක් තිබෙන බව අපට පේනවා. ඔහු ජනාධිපතිවරණයට ඉල්ලන්නත් ඇත්තේ ඒ ජනතා කැමැත්ත දැකලා වෙන්න පුළුවන්. ඒත් දේශපාලකයෙක් හැටියට ඔහු කොහොම වේද යන්න කියන්න තවම කල් වැඩියි. සමහරුන්ගෙ මතය හමුදාවක දැඩි කැපවීම් සහ තදබල නිර්දය පුහුණුවීම් වලට අවුරුදු ගණනක් මුහුණදීලා දෘඪ සිතක් ඇති කෙනෙක් ජනතාවට එතරම් කාරුණික නොවේය යන්න. හමුදා හැඩ ගැස්මයි දේශපාලනයයි දෙකක් බවයි ඔවුන් කියන්නෙ.

අනික දේශපාලන ඔහුට හුරු දෙයක් නොවේය කියලත් කියනවා. ඒක අපිත් දන්නවා. ඊළඟ කාරණේ ඔහුට හොස්ස ළඟින් මැස්සෙක් ගියත් කේන්ති යන ගතියක් තියනවා කියන එක. දේශපාලන කපටිකම් ඔහු ප්‍රගුණ කරලා නැහැ. ඒ නිසා දේශපාලනය නොගැලපෙන බවයි ඇතැම් අය දකින්නෙ.

සරත් ෆොන්සේකා සමග හිටි යූ ඇන්පී සහ ජේවීපී දෙගොල්ල ඔහු හිරෙන් නිදහස්වෙලා ආවට පස්සෙ ඈත්වෙලා බව පේන්න තියනවා. ඒ අතරෙ තව කතාවක් යනවා ඔහු ළඟදිම රජයත් සමග එකතුවේය කියලා. ඔව්! ඒකත් වෙන්න බැරි දෙයක් නෙවෙයි. මේ දේවල් කොහොම වුනත් මේ අතරේ භයානක දෙයක් අපට පේනවා. සරත් ෆොන්සේකා මහත්තෙයා ඒ ගැන හිතුවද අපි දන්නෙ නැහැ. මෙන්න මේකයි කාරණේ.

හමුදාවෙන් හිරෙන් නිදහස්වෙලා එළියට ජන සමාජේට ආපු සරත් ෆොන්සේකා දැන් ඉතා **විවෘත ඉලක්කයක්**. ඉංග්‍රීසියෙන් කියනවා **Open Target** කියලා. ඒ කියන්නෙ කිසි බාධාවක් මුවාවීමක් නැතුව කෙලින්ම ඉලක්කය අරගත හැකි හොඳට පේන දෙයක් බවට ඔහු දැන් පත්වෙලා තියෙන්නෙ.

අපි දන්නවා ලලිත් ඇතුළත් මුදලි, රන්ජන් විජේරත්න, ගාමිණී දිසානායක, ලකී අල්ගම, බ්‍රිගේඩියර් ජානක පෙරේරා වැනි අයට මොකද වුණේ කියලා. ඇතුළත් මුදලි මහතා ආරක්ෂක ඇමති වෙලා ඉඳලා ඉන් අස්වෙලා දේශපාලනයට ගියා. එල්ටීටීඊ එක බලාගෙන හිටියා උඹ කවදහරි දවසක එළියෙ විවෘත තැනකට ඒවි නේ, එදාට බලමුකො කියලා. කාගෙ හිතෙන් ඇත්වුණත් කොටියන්ගෙ හිතෙන් පළිගැනීම ඈත්වෙන්නෙ නෑ. ඒ ඝාතනය ගියේ ජනාධිපති ප්‍රේමදාසගෙ පිටින්. මොකද ඒ දෙන්නා ඒකාලෙ විරසක වෙලා හිටපු නිසා. කොටින්ගෙ වැඩ එහෙමයි. හැම දේකින්ම ප්‍රයෝජනේ ගන්නවා.

සරත් ෆොන්සේකා කොටියන්ගේ **Hit List** එකේ මුලටම ඉන්න කෙනෙක් බව අපි දන්නවා. දැනටම දෙමළ ඩයස්පෝරාව සැලැස්මක් ගහලා ඇති. එක සැරයක් බෝම්බයක් බඩේ බැඳගෙන කොටිදෙනක් බඩදරු අම්ම කෙනෙක් වගේ ඇවිත් ඇඟට පැන්නා. සෑහෙන්න තුවාල වුනත් පොන්සේකා එදා බේරුණා කෝප්‍රල් යකඩාවල ඒ ගෑනිට පයින් ඇන්න නිසා. ඒ කෝප්‍රල් විරුවා ඒ පිපිරීමෙන්ම පරලොව ගියා. කොටින්ට පුලුවන් ඕනම ඝාතනයක් කරලා ඒක ආණ්ඩුව පිටින් දාන්න.

කොටි තවමත් ලංකාව ඇතුලෙත් පිටතත් කලින් වගේම ක්‍රියාත්මක බව සරත් පොන්සේකා ඇතුළු ඒ පවුලේ අයත්, රට වැසියනුත් හොඳින් දැනගත යුතුයි. සරත් පොන්සේකා මහතා කොටින්ගේ ගොදුරක් බවට පත් නොකර ඔහුට අවශ්‍ය ආරක්ෂාව නොඅඩුව සපයා ඔහු සුරකින්නට කටයුතුකරන ලෙස ඔහුගේ පාක්ෂිකයන්ගෙනුත් මේ රජයෙනුත් අපි උදක්ම ඉල්ලා සිටිනවා.

♦ **වෙලේගෙදර රාළ London**